YSL
Migration Services

MIGRATION
SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: 03 8794 9818 | 03 8794 9297 :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

# විදර්ශනා




වැව් දිය මත
දිය වන වෙන සඳ
සෙළ වෙන සඳ
හද අඹරේ පෑයූ සඳ
නොකියූ රහසක් සුන්දර
ලියුවා වැව් බැම මත්තේ

බස්සෝ නොදොඩා කිසි බස්
තුරු අග පැද්දී නැළවී
කියවයි ආදර ගීතේ
විදහා නෙත් විහිදා ඉතා
ලියනා වැව් බැම මතේ

මුව මී ගන්නට රිසිසේ
ලහි ලහියේ යුහුසුළු විය
දහස් ගණන් පුෂ්ප සුවඳ
එක විට දෙසිතකට දැනී
සහස් වතාවක් නැතිවිය......
යළිත් දැණින පුෂ්ප සුවඳ
ගීත ස්වර වැයෙනා'තර
ආශාවේ අඳෝනාවේ
සිහින් සරින් නැගුණු ගැඹුරු
සුසුම් හඬින් මන්මත්විණා

අහස ගිගුම් දී නැවතිණා
භූමි චලන වී නැවතිණා
මොර සූරණ වැසි නැවතිණා
තදින් හැමූ සුළං ගොළුව

නැවුම් ගොමෙන් නැහැවූ පිළ
නැවුම් පිදුරු හෙවිළි හිස
සඳ පානේ බබළන සඳ
නැවුම් සොඳුරු සිතිවිලි නෙක
හෙමින් හෙමින් ගොඩවැදුනා
ගෙපැළ තුළට පිල් කඩ නැග

සීත රැයේ
දිළෙන සිලේ
රන්වන් රන් රශ්මි වැදී
දෑස කියන පෙම් කතා
දෑසින් දැක තුටුවෙලා

සඳ රැස් නැහැවී නැහවී
රන් වන් රන් වළාවන්
අප දෙදෙනා දෙස බලා
ඉවත ගියා ඉඟිමරා
සැඟ වෙන්නට කඳු ඉරා

රටා ඇන්ද මිඳුළ පුරා
සරා සඳේ කැළුම් දිළේ
වටා රඟන ගොයම පුරා
පුරා රනින් කරල් රඟේ

කලාලයේ සොඳුරු රටා
යුග දෙනෙතින් වියන
සිතාරයේ ස්වර රටා
හෙළනා සුසුමින් වැයෙන
ආදරයේ අටුවා ටිකා
ටික ටික කියවමින
ජීවිතයේ මන්දිරයට
හොරෙන් හෙමින් ඇදෙන

තේ දල්ලක සුවඳ අරන්
ළමැද සිපින කුසලානය
නා දල්ලක පැහැය අරන්
තොල් පෙති සිරවූ වදන්

සොබා සිරිය කැටි වී හකුළා
අමා සුවය කළතා මිරිකා
අතැඹුළකට නංවා
මැවුනු රුවා
ඇයම වුවා
ඇසෙන හඬා
ඇගෙම වුවා

සඳ පෑයූ සඳ අහසේ
දිළි තරු තුරු අග හැපී
ගහ කොළ ගජගා වන්නම
රඟති - හමයි පන්සිළු

යාය පුරා විසිරි කුමුදු
කුසුම් පුසුඹ දෙයි නිරතුරු
දිවයන පැනයන හාවෝ
ඉඳහිට දෙති රඟ තුටින්
ගොඩට ගැලූ සයුර සිඳිණා

ඔබ මා වී
මා ඔබ වී
කෙනෙකු නැතුව ගිය ඇසිල්ල
කල්ප කල්පයක් හකුළා
ඇසුරු සැනින්
ගෙවී ගියා

ලුහු බැඳ ආ පසුතැවිල්ල
සතුට තල්ලු කර පස්සට
ඉදිරියටම ඇදී ගියා
මුදුනට වී ගිරි සිඛරයෙ
බලා උන්නු මට පෙනුනා

සිළට ඇදෙන මෙරු එක එකා
අත් තටු ගැන නොම තකා
රඟයි රැඟුම් දැල වටා
ජීවිතයද හැර දමා

මදකට දෙන සුව අමා
කලකට හෝ නොම මැකී
සුරා මතින් මත් වී අද
මතේ සරයි එකිනෙකා
ඉතිහාසේ ඉස්මත්තේ
අනාගතේ අමුණලා

ආශාවේ ආලෝකය
තණ්හාවේ තෙල් දවයි
ජීවිතයේ තිරය ගෙවෙයි
ඉතිරිව දැළි රොඬු ගොඩක්

ඇහැට ඇහැක්
කණට කණක්
රුවට රුවක්
අරූපීව
වින්ද සුවය
විරූපීව
දියවී පාවී ඈතට
ඇදුනා මතකෙන් ඔබ්බට
පිපි මල් පරවී වැටෙද්දි
සඳ බැස යන විට හෙමිහිට
හිරු නැග එන විට හනිකට

*(විරාමය)*

**සාමන්ත තැන්නගේ**